"කෝපි කෝප්පයක් හදන්නද?" මගේම හඬ මට ඉතා සිහින්ව ඇසිණි.

"ෂා...... කොච්චර හොඳද? බොමු බොමු"

මට යම් තරමක අස්වැසිල්ලක් දැනුණි . ඊට හේතුව වූයේ ඉඳුවර අභිමුවේ නිරුත්තර නොවීමට තරම් ධෛර්යයක් මා තුල ගොඩනැගෙමින් තිබීමය. කෝපි කෝප්පය පිළියෙළ කරන තුරු මම මගේ කැළඹුණු සිත සන්සුන් කර ගැනීමට ප්‍රයත්න දැරුවෙමි. ඔහු විසිත්ත කාමරයේ වූ පත්තර ගොටුවෙන් සඟරාවක් තෝරන හඬ පවා මට ඇසේ. මොහොතකින් ඔහු මුළුතැන්ගෙට ඇතුළු වූවේය.

"ඔයා සිනමා සඟරා බලනවද?"

කුඩා කෑම මේසයේ පුටුවක් ඇද ඉඳ ගනිමින් ඔහු ඇසුවේය. මම හිස සලා කෝපි බඳුන ඔහුට පෑවෙමි. කෝපි උගුරක් රස බැලූ ඔහු මා දෙස පුදුම සහගත බැල්මක් හෙළුවේය.

"ඔයා බොහොම රසට කැපුචිනෝ හදනවනෙ"

"මෙහෙ ආපු අළුත මං කොෆි ෂොප් එකක වැඩ කරා.. .එතනදි ඉගෙන ගත්තෙ" මම සීරුවෙන් හඬ අවදි කළෙමි.

"ජීවිතේ හැම සිදුවීමක් අවසානයේම අපි යමක් ඉගෙන ගන්නවා. අන්තිමට ඒ ඉගෙනුම අපේ ජීවිත වලට ලොකු ආලෝකයක් දෙනවා. එහෙම නේද? "

මම හිස සලා එකඟත්වය පළකළෙමි.

"මං කෝපි කෝප්පයක් බොන්න ආයෙම එන්නං , මනහාරි ආපුවම"

මම වික්ෂිප්තව ඔහු දෙස බැලුවෙමි.

"ඔයාට පුදුම ඇති නේද? මං කොහොමද එයාව දන්නෙ කියලා, මනික් කියන්නෙ මගෙ අයියගෙ ලොකු පුතා. මනහාරි බැලරාට් යන්න කලින් මට එයාව මනික් මුණගැස්සුවා. එයාගෙන් තමා මට ඔයා ඉන්න තැන දැන ගන්න ලැබුණේ. මනහාරි මගෙන් ඉල්ලීමක් කරා" ඔහු ඉතාම තැන්පත් හඬින් කථා කළේය.

"මොකක්ද දුවගෙ ඉල්ලීම" මම කලබලයට පත් වී සිටියෙමි. ඒ බවක් මගේ හඬේ ගැබ් වී තිබුණි.

"එයා මට කිව්වා, අනේ අංකල් අපේ පුංචිව පාරෙදි බය කරන්නෙපා , ගෙදරට ගිහිං කථා කරන්න කියලා"

ඔහු කොක් හඬලා සිනාසුනේය. මම උඳුනට පිටුපා ඔහු දෙස බලා සිටියෙමි. එබඳු කවටකමක් හමුවේ කෙසේ හැසිරිය යුතුදැයි මා තුල අවබෝධයක් නොතිබුණා විය හැකිය. ලැජ්ජාව මුසු හැඟීමකින් මඬින ලද මනසින් යුතුව මම නිහඬව සිටියෙමි.

"දුලිනි" ඔහු මට ප්‍රථම වරට මගේ නමින් ආමන්ත්‍රණය කළේය.

"මෙතනින් ඉඳගන්න, අදවත් මාත් එක්ක කෙළින් කථා කරන්න. අපි අපේ ජීවිත වලින් අවුරුදු පහළොවක් විතර නිකරුනේ නැති කරගත්තනෙ. එහෙම නේද?"

"මට ඔයාට කියන්න ගොඩක් දේවල් තියෙනවා වගේම ඔයාගෙන් දැනගන්නත් ගොඩක් දේවල් තියෙනවා. මගේ මුළු ජීවිතේම අවුල් වුණා දුලිනි. ඒ වගේම මං හොඳටම දන්නවා ඔයාගෙ ජීවිතෙත් අවුල් වුණ බව. ඇයි ඔයා සසංකගෙන් අයින්වෙලා මෙහෙ ආවෙ?"

මම හිමිහිට ඇවිදගෙන අවුත් පුටුවක ඉඳගතිමි. අද කෙසේ හෝ ඉඳුවර සමඟ කථා කළ යුතු බව මම මගේ යටි සිතට තරයේ කියාසිටියෙමි.

"සසංකට වෙන......" මට කියා ගත හැකි වූයේ එපමණකි. උගුර සිරවී මට හැඬුම් ආයේය.

"සසංක ඔයාව බඳිනකොටත් එයාට චත්‍රා එක්ක දුර දිග ගිය සම්බන්ධයක් තිබුණා" ඉඳුවර පුටුවෙන් නැගිට ජනේලය අසලට යමින් කීවේය. මට නිදහසේ හඬන්නට ඉඩදිය යුතු නිසා ඔහු මට පිටුපා ජනේලය අසල සිට ගත්තේය.

"වෙන්නැති, චීගොල්ලන්ට ලොකු පුතෙක් ඉන්නවා" මම හැඬුම් අතරින් කීවෙමි.

"මං අම්මටයි අප්පච්චිටයි අකීකරු වෙන්න කැමති වුණේ නැහැ ඉඳුවර. අපේ අක්කත් නාත් අයියව බැන්දෙ අම්මලා ගෙනාපු යෝජනාවකින්. චීගොල්ලො අදටත් ලස්සනට ජීවත්වෙනවා. මේක මගේ ලැබීම වෙන්නැති." හැඬුම් නවතා ගත් පසු මම කථා කළෙමි.

"වෙන්නැති, හැබැයි මේක මගේ නොලැබීම වෙන්නැති " ඔහු අවසන් කෝපි උගුරත් බී කෝප්පය මේසය මත තැබූවේය.

"ඉඳුවර කසාද බැන්දද?"

"බැන්දා....එයා බ්‍රසීල්, අවුරුද්දක්වත් අපට එකට ඉන්න බැරිවුණා,පස්සෙ වෙන් වුණා.හැබැයි අපි තරහ නෑ.අදටත් ඉඳ හිට ඊමේල් එවනවා."

"ලංකාවේ ගුරුවරු දෙන්නෙක්ගෙ දුවක් ලඟ දැක්ක ගෑණුකම ලතින් ඇමරිකන් ගෑණියෙක්ගෙන් හොයන එක ප්‍රායෝගික නැහැ.මං එතනදි දැන දැනම වරද්දගත්තා දුලිනි."ඔහු බර හුස්මක් ගෙන නැවතත් අසුන් ගත්තේය. "ඔයා සසංකව දන්නෙ කොහොමද?"

"ඒක මහ දිග කථාවක් දුලිනි, මං ඒ කථාව අද ඔයාට ඊමේල් කරන්නං,මොකද මට රහට කථා කියන්න බැරි වුණාට ලියන්න පුළුවන්"

ඔහු කුඩා දරුවකු මෙන් සිනාසුණේය. මම ඒ සිනාව නෙත පුරා දැකගතිමි.ඉඳුවර නික්ම ගිය පසු මම යළිත් ගෙත්තම අතට ගෙන ඇඳි පුටුවට බර වුණෙමි. මටත් නොදැනී අතීතයේ අඳුරු අහු මුළු අතරේ මගේ මතකය සැරිසරන්නට විය.මෙතැන් සිට ලියවෙන්නේ එසේ දිගහැරුණු තිස්පස් වසරක මගේ ජීවිතයේ කඳුලින් ගෙවුණු තෙවසරක මතකයයි.

**මතු සම්බන්ධයි**




# New Year

A new year can be a new start
Let go of everything that held you back
And make something out of this year
Become a better person
Succeed in what you dedicate your time to
Do something out of the ordinary
And surround yourself with people that make you happy
Be that person that you always dreamed of being
Work hard
And make 2015 your year

2014 has passed and we are we are starting 2015. Make this year a fresh start and let go of anything that had held you back from achieving what you wanted last year. Get out and do what you want so that and the end of 2015 you will not regret anything. Look back at everything that had happened to you in 2014 and learn from your mistakes. Work hard and make 2015 your year.

It is important to balance your life out. Sure it is important to work and dedicate some of your time to your education or to your job, but it is also important that you leave aside time to spend your family, take up hobbies or just relax. It is important you do not let one thing completely take over your life and that you distribute your time to various different activities. By saying this it does not mean that you spend no tome on work or school and instead just relax. You must work hard and be dedicated to what you do but you also should give yourself time to breathe and just relax. You may want to plan your weeks and set aside time for yourself or just whenever you are feeling stressed or like you cannot concentrate on what you are doing anymore.



Do not put anything to chance and instead work hard to succeed all your goals that you set for yourself in 2015. Do not be discouraged and keep going even when you do face difficulties, it's never going to be an easy ride. Do not reach the end of the year and feel disappointed that you had not done anything that year and start to regret that you did not work harder. You want to reach the end of 2015 and feel proud of your accomplishments.

Make 2015 the year that you get out and do what you always wanted to do. Not relating to work or school just something that you have always wanted to do such as travelling somewhere or joining a club or taking up a hobby. Leave aside some time to do something for yourself that you may have always wanted to do but you never got around to it. Do something on your bucket list and organise an event that you can look forward to. Treat yourself this year for all your hard work.
Finally to make 2015 one of the best years so far remember to spend time with your family and friends. Share your year's successes and disappointments with your loved ones, they will be there to get you back up onto your feet when you fall and rejoice with you about your accomplishments. Call friends that you have not spoken to for a long time and always spend at least a small time with your family each day. You will create more memories, have more laughter and enjoy this year even more when you are surrounded by people that you care about.

Another year is upon us and let's make this one the most memorable one so far. Have a balance throughout the year by dedicating yourself to work or school, doing things that you enjoy and spending time with your loved ones. In 2015 you can start fresh and be a better person than last year, do not put anything off any longer and start to lead the lifestyle that you aspire and this will guarantee you happiness.

HAPPY NEW YEAR EVERYONE!!!

